# කතෝලික ධර්මය

# DRAFT

## ගුරු මාර්ගෝපදේශය

### පළමුවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපෑල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## පළමුවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

**කතෝලික ධර්මය**

**පළමුවන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

ප්‍රථම මුද්‍රණය - 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ගුරුභවතාට තම පාසල තුළ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූලික දෑ සැපයේ. විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් තම කාර්යයන්, දරුවාගේ බුද්ධි වර්ධනය කෙරෙහි මෙන් ම, චර්යාත්මක දියුණුව කෙරෙහි ද දිගු කාලීන බලපෑමක් ඇති කරවන බව නිරන්තරයෙන් ම සිහි තබා ගත යුතු වේ.

ප්‍රජානන සාධන මානය සම්බන්ධයෙන්, අනෙක් කරුණු අතරට, ඉගෙනීම ඉහළ මට්ටමකට ගෙන යාමට පහත සඳහන් කරුණු කෙරෙහි ද ගුරුවරුන් සැලකිලිමත් විය යුතු වේ.

- ශිෂ්‍යයා තම ජීවිත අරමුණු පිළිබඳ අවදියෙන් සිටීම සහ කළ යුතු කාර්යය, හැකියාවන්ට සහ අරමුණු සාධනයට අදාළ වීම.
- ශිෂ්‍යයා ක්‍රියාකාරීව ඉගෙනුම් කාර්යාවලියෙහි නිරත වීම. (ඉගෙනීම සිසු කේන්ද්‍රීය ක්‍රියාවලියක් වීම.) කන්ෆියුසියස් ගේ කියමන සිහියට නගා ගන්න; ඇසෙන දේ අමතක වේ. දකින දේ අමතක නොවේ. කළ දේ ඉගෙන ගැනේ.
- ඉගෙනුම් වාතාවරණය, ධනාත්මක ව, අභියෝගාත්මක වී, ඉගෙනුම් මෙවලම්, උපකරණ, විද්‍යාගාර, විවිධ සම්පත් ආකාරවලට පිවිසුම පහසු වීම.
- ශිෂ්‍යයාට ක්ෂණික ධනාත්මක සහ නිර්මාණාත්මක ප්‍රතිචාරයන් ලබා දීම මගින්, ඉගෙනුම ක්‍රමානුකූල ව ඉහළ මට්ටමක අවශෝෂණයකින්, ශිෂ්‍යයාගේ දැනුම, කුසලතා සහ අරමුණු සමග අනුකලනයකට අවකාශ ඇති කිරීම.

අධ්‍යාපනයේ දී, රජයේ අපේක්ෂාව වනුයේ සියලු පාසල්වල සියලු දරුවන්ට, මූලික විෂය කරුණු අවශ්‍ය මට්ටමකට ග්‍රහණය කිරීමෙන්, විභාගයට මුහුණ දීමෙන් පසුව සාර්ථකත්වයේ සතුට විඳ ගැනීමේ හැකියාව ලබාදීමය.

දරුවාගේ චර්යාත්මක වර්ධනයට අදාළ මානය සලකා බැලූ විට අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ප්‍රජානන හැකියාවන් වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීමයි. එබැවින් ගුරුවරුන් තමතින් විෂය නිර්දේශ ලබා දීමේ දී වර්ධනය කළ යුතු වන්නේ, පාසලින් බැහැර ලෝකය සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යයාට අවශ්‍ය වන, දක්ෂතා සහ කුසලතා ය. එයින් සමහර වැදගත් ගණීය හැකියාවන් පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වේ.

- කාර්යශීලී වැඩ ආචාර ධර්ම - සාධනීය ආකල්ප සහ නව නිර්මාණයට, සංරක්ෂණයට ඇති ලැදියාව
- අන්තර් පුද්ගල සම්බන්ධතා - කණ්ඩායම් වැඩ, විනය සහ කාර්යක්ෂම සන්නිවේදනය
- සදාචාරාත්මක හර - විවිධත්වයට ගරු කිරීම වැනි පුරවැසි වටිනාකම්වලින් හෙබි, ඍජු පුද්ගලයෙක්

අවසාන වශයෙන් මම සියලු විදුහල්පතිවරුන්ටත්, ගුරු භවතුන්ටත්, පාසල්වල අනෙක් කාර්ය මණ්ඩල සභිකයන්ටත්, ඉතා ඕනෑකමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය දෙස කළමනාකරණයේ ඒ 4 වශයෙන් හඳුන්වන පහත සඳහන් කරුණු මගින් තම සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලීමට කැමැත්තෙමි. එනම් ආකල්පය, විශ්ලේෂණය, ක්‍රියාව සහ වගවීමයි. ඔබ නියුක්ත වන කාර්යයෙහි (පාඩම ආදී වශයෙන්) අවසානයත්, මාර්ගයන් පිළිබඳ අදාළ සාධනීය ආකල්පයන්ගෙන් ආරම්භ කරන්න. එය සංවිධානය කර ගැනීම උදෙසා (වරු ඒකක ආදී වශයෙන්) තොරතුරු සොයා බලා ලබාගෙන ඒවා විශ්ලේෂණය කරන්න. විකල්ප සලකා බලා ක්ෂණික ක්‍රියා (ප්‍රකාශ කිරීම, බාරදීම) කාර්යක්ෂමව ගන්න. ඔබ ප්‍රතිඵල අධීක්ෂණය, ඇගැයීම සහ මිණුම සම්බන්ධයෙන් (අයිතිය) වගකීම බාර ගන්න.

මේ හා සම්බන්ධ සියලු ගුරු භවතුන්ට, ඉගැන්වීමේ දීත්, ඉගෙනීමේ දීත් සතුට අත්වේවා යයි ප්‍රාර්ථනා කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. අවශ්‍ය වුවහොත් මට ද පිටපතක් සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මෙම ගුරු මාර්ගෝපදේශය පිළිබඳ ඔබේ අත්දැකීම් සහ නිරීක්ෂණ ලියා දන්වා එවීමට නොපසුබට වන්න.

**මහාචාර්ය ගුණපාල නානායක්කාර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමි ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද, සුභාවිත තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද, මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද, අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ සහ සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුම ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක් වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි තේමා සහ නිපුණතා සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද, දෙගුරුනට ද, භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරු භවතුන් පෙළ පොත හා මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයවල සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය :**

**උපදේශකත්වය :** ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමීන් වහන්සේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

ගරු කේ. එච්. එච්. පියල් ජානක ප්‍රනාන්දු පියතුමා
ජාතික අධ්‍යක්‍ෂ, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

ගරු එම්. ග්‍රෙගරි ලක්ෂ්මන් ප්‍රනාන්දු පියතුමා
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (කතෝලික ධර්මය) අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු කාල්ටන් ද සිල්වා පියතුමා, කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මහතා
අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන)
ජාතික අධ්‍යාපන ආයතනය

**අනුමැතිය :** ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය :** නදී අමා ජයසේකර මිය,
අධ්‍යාපනඥ, ජාතික අධ්‍යාපන ආයතනය

සකුන්තලා රණසිංහ මිය,
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය.

**ලේඛක මණ්ඩලය :**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය -**

නදී අමා ජයසේකර මිය

**බාහිර සම්පත් දායකත්වය -**

ගරු කේ. එච්. එච්. පියල් ජානක ප්‍රනාන්දු පියතුමා

ගරු එම්. ග්‍රෙගරි ලක්ෂ්මන් ප්‍රනාන්දු පියතුමා

පී. ඩී. ෆිලීෂියා අයිරීන් මිය, ගුරු උපදේශිකා, කැලණිය අධ්‍යාපන කලාපය

ඒ. ජේ. ආර්. ගොඩ්වින් මයා, විදුහල්පති, වත්තල රෝමානු කතෝලික දෙමළ විද්‍යාලයය

ආර්. ඩබ්ලිව්. කේ. සී. එම්. එම්. රුක්ෂිනී නිර්මලා ප්‍රදිනාන්දු මිය,
ගුරු සේවය, යහපත් එඬේරාගේ කන්‍යාරාමය, කොටහේන.

**භාෂා සංස්කරණය :** ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මයා- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

# කතෝලික ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවෙන් දැක්වෙන ජාතික අරමුණු මෙම ශ්‍රේණියේ විෂය නිර්දේශ සැකසීම සඳහා පාදක කොට ගෙන ඇත. ජාතික පොදු අරමුණු කරා එළැඹීම පිණිස මූලික වන පොදු නිපුණතා ද එම වාර්තාවේ යෝජනා කර තිබේ.

මෙම නිපුණතා අතර ආගම හා ආචාර ධර්මවලට අදාළ නිපුණතා දරුවන් තුළ ඇති කරන ප්‍රධාන විෂයය කතෝලික ධර්මය යි. අනෙක් නිපුණතා ද දරුවන් තුළ ඇති කිරීමට කතෝලික ධර්මය විෂයයට උසස් මෙහෙයක් කළ හැකි ය. මේ අනුව අනාගත සංවර්ධනය නමැති ව්‍යුහය ගොඩ නැගීම සඳහා කතෝලික ධර්මයට ලබා දිය හැකි දායකත්වය අතිවිශාල ය.

ප්‍රාථමික ශ්‍රේණිවල කතෝලික ධර්මය විෂය නිර්දේශ සැකසීමේ දී අදාළ ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ වයස් මට්ටම, පරිණතිය, භාෂා හැකියා, රුචිකත්ව හා ලැදියා කෙරෙහි සැලැකිලිමත් වී තිබේ. ඒ අනුව එම දරුවන්ට ළඟා විය හැකි නිපුණතා හා ඒ සම්බන්ධ විෂය කරුණුවලට පමණක් සීමා වී මෙම විෂය නිර්දේශ පිළියෙළ කිරීමට උත්සාහ ගෙන ඇත. එ සේ ම උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී අත්දකින්නට ද, ක්‍රියාකාරකම් මගින් ඉඩ සලසා ඇත.

විෂය කරුණු ඉගෙන ගැනීම පමණක් නොව දේව අභිමතයට අවනත වෙමින්, දෙවි පියාණන්, ශුද්ධ බයිබලය, සාන්තුවරයන්ගේ චරිත, අවට සිටින අය, අවට පරිසරය සහ තමා අතර අන්තර් සබඳතා ගොඩනගා ගැනීම සඳහා කතෝලික බැතිමතකු තුළ තිබිය යුතු නිපුණතා ස්ථිර සාර ලෙස ඇති කිරීම ද මෙම විෂයයේ ප්‍රමුඛ අරමුණකි.

කුඩා ශිෂ්‍යයකුට කතෝලික ධර්මය ඉගැන්වීම අතිශයින් වගකීමක් සහිත ව කළ යුත්තකි. කුඩා අවධියේ ඉතා සුළු වූ හෝ කරුණක් සම්බන්ධයෙන් වැරැදි වැටැහීමක් ඇති වුව හොත් එය එම ශිෂ්‍යයාගේ මෙ ලොව ජීවිතයට පමණක් නො ව සදාතන ජීවිතයට ද බලපෑමට ඉඩ ඇත. එ බැවින් නො දන්නා හෝ සැකමුසු හෝ කරුණු ඇතොත් ඒ සියල්ල මැනැවින් දැන ගෙන නිවැරැදි දේ ම ඉදිරිපත් කිරීමට සියලු ගුරුවරුන් නිහතමානී විය යුතුවාක් මෙන් ම අවංක ද විය යුතු ය.

ශිෂ්‍යයන්ගේ ජීවිතවලට ආදර්ශයක් වන පරිදි තමා ද යහපත් ජීවන පැවැත්මෙන් යුතු වෙමින් මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම ගුරුවරුන් ගේ වගකීම යි.

එක ම ගුරුවරයකු විසින් නම්‍ය කාල සටහනක් ක්‍රියාත්මක කිරීමෙන් දරුවන්ට වඩාත් හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගත හැකි ය.

**ප්‍රාථමික අවධිය සඳහා වන නිපුණතා**

1. දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල ඇසුරෙන් අත් දකියි, තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.
2. දෙවි පියාණන් වහන්සේ සමග කතා කරයි.
3. දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි.
4. ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.
5. සාන්තුවරයන්ගේ චරිත හා ශුද්ධ බයිබලය හඳුනා ගනියි.

1 - 5 ශ්‍රේණි දක්වා ප්‍රාථමික අවධියේ කතෝලික ධර්මය පිළිබඳ ඉගෙනුම් අත්දැකීම් ලබන සිසුන්, ප්‍රාථමික අවධිය අවසාන කරන විට උක්ත නිපුණතාවලට ළඟා වීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා අදාළ විෂය අන්තර්ගතය, විෂය නිර්දේශවල දක්වනු ලබන අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා යෝජනා කර ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය වඩාත් නිර්මාණශීලී ව භාවිතා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අත්දැකීම් ලබාගැනීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් ලෙස පමණක් පෙළ පොත යොදා ගැනීම සුදුසු ය.

**ඉගැන්වීමේ ක්‍රමෝපාය**

ප්‍රාථමික ශ්‍රේණිවල කතෝලික ධර්මය ඉගැන්වීමේ දී ශිෂ්‍යයන් ප්‍රිය කරන ආගමික ජීවිතය හා සමීප ක්‍රියාකාරකම් බහුල ලෙස යොදා ගත යුතු වේ. වන්දනාව, ආගමික චාරිකා, දේව මන්දිර නැරඹීම, වත්පිළිවෙත් මේ අතර ප්‍රධාන තැනක් ගනියි.

තවද බයිබල් කතා, සාන්තුවර චරිත කතා, සභා ඉතිහාසය හා සම්බන්ධ කතා දෘශ්‍යාධාර සමග රසවත් ව ඉදිරිපත් කළ යුතු ය. මේ හා සම්බන්ධ ගායනා, රංගන, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්ය මුසු ක්‍රියාකාරකම්වල දරුවන් නිරත කරවීමට ද නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු වෙයි. එය ශිෂ්‍යයාට වින්දනයක් ගෙන දෙන ලෙස ඉතාමත් සුන්දර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් බැවින් එම ක්‍රමවේද සියල්ලෙන් කතෝලික ධර්මය ඉගෙනීමට දැඩි ආශාවක් දරුවන් තුළ ඇති වනු ඇත. එ මෙන් ම ශිෂ්‍යයා ක්‍රමයෙන් ජේසුස් වහන්සේ වෙතට සමීප කිරීමක් ද සිදු වේ.

**පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්**

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් කතෝලික ධර්මය විෂය සම්බන්ධ නිපුණතා බොහොමයක් ආවරණය කළ හැකි ය. එසේ ම තහවුරු කළ හැකි ය. තව ද පාසල් සංස්කෘතිය තුළ මෙම නිපුණතා ගොඩනැඟෙන නව අංග ඇති කිරීම කෙරෙහි ද විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. පළමු වන ශ්‍රේණියේ දී ඉතා සරල ව අරඹා පස් වන ශ්‍රේණිය දක්වා මෙම වැඩසටහන ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

පාසල අයිති මීසම භාර පියතුමා හෝ ළඟ ම පිහිටි දෙව් මැඳුරක නැතහොත් ආයතනයක පියතුමා හෝ හමුවීමට සිසුන්ට අවස්ථාව සලසා දීම සුදුසු ය. එ සේ ම වාරයකට අවම වශයෙන් දෙ වතාවක් වත් දෙව් මැදුරට ළමයින් රැගෙන යාමෙන් දෙවි පියාණන් වහන්සේ ගේ ආදර පහස විඳීමට ඔවුන්ට අවස්ථාව සැලසේ.

පවිත්‍රතාව, විනීත බව, සහයෝගය, ගුරුවරුන් කෙරෙහි පැවැත්විය යුතු ආචාර ධර්ම, ආශිර්වාද ඇසුරෙන් ගොඩ නැඟෙන සමානාත්මතාව, සුහදත්වය, සහයෝගය ආදී ලක්ෂණවලින් පාසල් පරිසරය හා සම්බන්ධ සංස්කෘතිය අලංකාර කෙරේ. ඉහත සංස්කෘතිය තුළ කතෝලික ධර්මය විෂයයෙන් අපේක්ෂිත නිපුණතා වර්ධනය වන අවස්ථා උදා කළ හැකි ය. මෙ මඟින් විෂය තුළ දී ඉගෙන ගන්නා සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

**තක්සේරු කිරීම**

ප්‍රාථමික ශ්‍රේණිවල දී ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් මේ සඳහා උචිත වෙයි.

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවුඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| කතෝලික ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vi |
| විෂය නිර්දේශය | ix |
| ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |

# විෂය නිර්දේශය

# හැඳින්වීම

ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා පාදක වන මූලික නිපුණතා ඇසුරින් 'ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා' දරුවන් තුළ ගොඩනැංවීම 'ආගම' විෂයයේ වගකීම වෙයි.

කුඩා දරුවකුගේ ළපටි මනසෙහි අලුත් යමක් රෝපණය කිරීම පහසු ය, එ සේ ම යහපත් චර්යා සහ වත් පිළිවෙත්වලට කුඩා දරුවකු අනුගත කිරීම ද වඩා ඉක්මනින් කළ හැකි ය. කුඩා දරුවකු තුළ පවත්නා එම ගුණාංගවලට මනා ව ගැළපෙන සේ මෙහි විවිධ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. විෂය අන්තර්ගතයට අනුකූල ව සිසු දරුවාට අදාළ නිපුණතාව ලබා දෙමින් ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීමට එම ක්‍රියාකාරකම් ඔබට මාර්ගෝපදේශයක් වනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

සමාජයක සාමය සහ සදාචාරය පවත්වා ගැනීමට සියලු ම ආගම්වලින් ලැබෙන දායකත්වය සුළුපටු නො වේ. තව ද, තමා හැම අයුරින් ම පෝෂණය කර ගුණාත්මක ජීවිතයක් ගත කිරීමට ශ්‍රම දායකත්වය සපයන මිනිස් සමාජයට කෘතවේදී වෙමින් පෙරළා අවංක සේවයක් කිරීමටත්, යහගුණවලින් හෙබි මනුෂ්‍යයකු ලෙස අභිමානයෙන් යුතු ව ජීවත් වීමටත්, ආගමකින් ලැබෙන පන්නරය අතිමහත් ය. එ පමණක් නො ව අප එකිනෙකා විශ්වාස කරන පරිදි මරණින් ඔබ්බෙහි දී ද යහපතක් උදා කර ගැනීම සඳහා ආගමික ඉගැන්වීම් අපට නිසැක ව ම පිහිට වෙයි.

දැහැමි සමාජයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යය ආරම්භ කළ යුත්තේ ප්‍රාථමික අවධියේ කුඩා දරුවා ගෙනි. ඒ මහඟු කර්තව්‍යය භාර ගෙන සිටින භාග්‍යවන්ත වූ ගුරුභවතා ඔබ යි. ඒ සඳහා ඔබෙන් ලැබෙන දායකත්වය සහ කැපවීම මහත් සේ අගයමු.

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

### i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

### ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

### iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය


vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම



# කාලය බෙදා ගැනීම

## පළමු වන ප්‍රධාන අවධිය (පළමු වන සහ දෙ වන ශ්‍රේණි)

| | **විෂයය** | **සතියකට වෙන් කර ඇති කාලය** | |
|---|---|---|---|
| 1. | මවු බස | පැය 5.00 | |
| 2. | ගණිතය | පැය 3.30 | |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5.30 | |
| 4. | ආගම | පැය 1.15 | |
| 5. | දෙවන ජාතික භාෂාව | මිනිත්තු 30 | |
| 6. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 | (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 7. | විවේක කාලය | පැය 1.15 | (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 8. | ආහාර ගැනීම සඳහා | මිනිත්තු 50 | (දිනකට මිනිත්තු 10 බැගින්) |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 1.40 | (දිනකට මිනිත්තු 20 බැගින්) |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 | (සතියේ එක් දිනෙක) |
| | **සතියක මුළු කාලය** | පැය 21.15 | |

# විෂය අරමුණු

1. සමාජයේ ගෞරවාදරයට බඳුන් වන සැදැහැවත් කිතුනු දරුවකු බිහි කිරීම
2. කිතුනු ප්‍රතිපත්ති අනුගමනය කරන ජීවන දර්ශනයක් ගොඩනංවා දීම
3. ශුද්ධ බයිබලය යනු දේව වචනය බව දැනුවත් කරමින් ශුද්ධ බයිබලයට අනුකූල ව ජීවත් වීමට දිරි ගැන්වීම
4. දෙවි පියාණන් වහන්සේ සමග ආත්මීය සබඳතා ගොඩනඟා ගැනීමට පුරුදු පුහුණු කිරීම
5. මරියතුමිය ගේ සහ ශාන්තුවරයන්ගේ චරිතවලින් ආදර්ශ ලබා දීම
6. දේව තිළිණයක් වූ පරිසරය ආරක්ෂා වන සේ ද, සකසුරුවම් ලෙස ද, පරිහරණය කරමින් තව දුරටත් සංවර්ධනය කර ගැනීමේ ආකල්ප ජනිත කිරීම
7. ස්වභාව ධර්මය හා තමා අවට ජීවත් වන අය මගින් දේව ආදරය අත් විඳීමට සහ ප්‍රතිප්‍රේමය දැක්වීමට අවස්ථා සම්පාදනය කිරීම
8. සියල්ලන්ට ම ප්‍රේම කරමින් කණ්ඩායමක් තුළ එකමුතු ව සමඟියෙන් කටයුතු කිරීමේ කුසලතා රෝපණය කිරීම
9. අන්‍යාගම්වලට ද ගරු කරමින් සහයෝගිතාවෙන් යුතු ව ජීවත් වීමේ මැදහත් ගුණාංග වර්ධනය කිරීම
10. ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ වගකීම් සහ කාර්යභාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1. **මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම** | 1. මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල ඇසුරෙන් අත් දකියි; තුති පුදයි; ප්‍රතිප්‍රේමය දක්වයි. | 1.1 ගස්වැල්, මල් එල, සතුන් ඇතුළු ලස්සන ලෝකය |
| | | 1.2 මහෝත්තම දෙවි පියාණන් වහන්සේ දුන් විශ්මය ජනක මිනිස් සිරුර සිරුර නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම සහ පවිත්‍රව තබා ගැනීම<br>• දෑස්, දෙසවන්, නාසය, මුව, දෑත්, දෙපා |
| | | 1.3 අම්මා, තාත්තා, සහෝදර, සහෝදරියන්, ආච්චි, සීයා, සමීප නෑදෑයන් ආදි පවුලේ අය |
| | | 1.4 ගුරුවරුන්, අසල්වැසියන් හා මිතුරු මිතුරියන් |
| | | 1.5 ගස්වැල්, මල්, සුරතල් සතුන් හා කුරුල්ලන් ඇතුළු මහෝත්තම දෙවි පියාණන් වහන්සේ දුන් ලස්සන ලෝකයට ආදරය කිරීම සහ එය සුරැකීම |
| 2. **මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමග කතා කිරීම** | 2. මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමග කතා කරයි. | 2.1 හිස පහත් කිරීම, දණගැසීම, වැඳීම යන වන්දනා කිරීමේ ඉරියව් |
| | | 2.2 සාන්ත කුරුසය ලකුණ සලකුණු කිරීම/ශුද්ධ වූ ත්‍රිත්වය සාන්ත කුරුසය යාච්ඤාව ඇතුළත් මූලික යැදුම |
| 3. **මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු වීම** | 3. මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි. | 3.1 ප්‍රසාද ස්නාපනය |
| 4. **උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග** | 4. උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි. | 4.1 උත්තරීතර ජේසුස් වහන්සේගේ මව වූ මරිය මෑණියන් හඳුනා ගැනීම |
| | | 4.2 උත්තරීතර ජේසුස් වහන්සේගේ සුරැකි පියා වූ ජුසේතුමා හඳුනා ගැනීම |
| | | 4.3 ගව මඩුවක උපන් උත්තරීතර ජේසුස් වහන්සේ |
| | | 4.4 උත්තරීතර ජේසුස් වහන්සේගේ පළමු වන පුදුම ක්‍රියාව |
| | | 4.5 කුරුසියේ මරණයට පත් වූ උත්තරීතර ජේසුස් වහන්සේ |

| **තේමාව** | **නිපුණතාව** | **විෂය අන්තර්ගතය** |
|---|---|---|
| 5. **ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත** | 5. සාන්තුවරයන්ගේ චරිත හා ශුද්ධ බයිබලය හඳුනා ගනියි. | 5.1 ශුද්ධ බයිබලය |
| | | 5.2 ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා |
| | | 5.3 සාන්ත ආනාතුමිය |
| | | 5.4 සාන්ත අන්තෝනි තුමා |
| | | 5.5 සාන්ත සෙබස්තියන් තුමා |
| | | 5.6 අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 1.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේට ආදරය කිරීම

**1.0 නිපුණතාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල ඇසුරෙන් අත්දකියි; තුති පුදයි; ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.1

- ලස්සන ලෝකය වර්ණනා කරමින් එය රැක ගත හැකි ආකාරය සාකච්ඡා කරයි.
- ලස්සන ලෝකය චිත්‍රයට නගයි, පෝස්ටරයක් සකසයි.
- ගීතිකාවක් මගින් ලස්සන ලෝකය දුන් මහෝත්තම දෙව් පියාණන් වහන්සේ පසසයි.

**ඉගෙනුම් සම්පත්** :

- මල්, ගෙඩි පිරුණු ගස්වැල්, සතුන්, ස්වාභාවික පරිසරය ඇතුළත් ලස්සන මැවිල්ල දැක්වෙන පින්තූරයක්
- කිතුනු ගී පොත, චිත්‍ර සහ පෝස්ටරයක් සකස් කිරීමට අවශ්‍ය දේ

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

පියවර 1 :
- එළිමහනට ගොස් සිසුන්ට ලස්සන පරිසරය දකින්නට සලස්වන්න.
- පරිසරයේ ලස්සන වර්ණනා කිරීම හා පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳ සුහද කතාබහක යෙදෙන්න.
- සිසුන් සමග පහත ගීතය ගායනා කරන්න.

**ගස් පිරිලා මල් ගොඩයි හරි ම ලස්සන යි**
**අප නෙළන්නෙ මල් ටිකයි ඉතිරිය ගසට යි**
**මුළු ගසේ ම මල් නෙළුවොත් ගසට දුක හිතෙයි**
**සමනලයට බඩගින්නේ ඉන්නට සිදු වෙයි**

පියවර 2 :
- ලස්සන මැවිල්ල දැක්වෙන පින්තූරය ප්‍රදර්ශනය කරන්න.
- ඉදිරිපත් කළ පින්තූරය පිළිබඳ සාකච්ඡා කර ඒවායින් සිසුන් කැමති දේ ඇඳීමට අවස්ථාව දෙන්න.
- බ්‍රිස්ටල් බෝඩ් 2ක් හෝ වැඩි ප්‍රමාණයක් සිසුන්ගේ උස මට්ටමට සරිලන සේ බිත්තියක සවි කොට සිසුන් ලවා අඳිනු ලබන දෙව් පියාණන් වහන්සේ මැවූ දේ අලවමින්, විශාල පෝස්ටරයක් නිර්මාණය කරවන්න.

**තක්සේරුව** :

- ලස්සන ලෝකය දුන් මහෝත්තම දෙව් පියාණන් වහන්සේ පැසසීම පිණිස, ඔවුන් වහන්සේ මැවූ දේ අලවා විශාල පෝස්ටරයක් නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා** :

- පරිසරය ආරක්ෂා කිරීමට යොමු වීම

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**1.0 නිපුණතාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල ඇසුරෙන් අත් දකියි; තුති පුදයි; ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.2

- මිනිස් සිරුර මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ අනර්ඝ නිර්මාණයක් බව ප්‍රකාශ කරයි.
- ශරීරය ආරක්ෂා කර ගත හැකි අයුරු ප්‍රකාශ කරයි.
- මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය අත්දකිමින් සිරුරේ අවයවවල ප්‍රයෝජන සාකච්ඡා කරයි.
- මහෝත්තම දෙවි පියාණන් වහන්සේගෙන් ලද විශ්මයජනක ශරීරය අගය කරමින් ගීතිකා ගායනා කරයි.
- තම සිරුර පවිත්‍ර ව තබා ගැනීමේ අගය ප්‍රකාශ කරයි.
- මහෝත්තම දෙවි පියාණන් වහන්සේ තමාට ලබා දුන් සිරුර පවිත්‍ර ව තබා ගැනීමෙන් ඔවුන් වහන්සේට ප්‍රතිප්‍රේමය දක්වයි.

**ඉගෙනුම් සම්පත්** :

- මල්, ඉඟුරු, දෙහි කොළ, කුරුඳු පොතු ආදී සුවඳ සහිත දේ
- ළමා ගීත අඩංගු හඬ පටයක් සහ වාදන යන්ත්‍රයක්
- '**යහපත් දේ දැනගන්නට**' යන ගීතය (සපයා ඇත.) ලොකු අකුරින් ලියන ලද පෝස්ටරයක්
- බෝනික්කෙක්

**ඉගෙනුම්-ඉගැන්වීම ක්‍රමෝපාය :**

පියවර 1 :
- එළිමහනට ගොස් සිසුන්ට ස්වල්ප වේලාවක් දෑස් වසා සිටීමට ඉඩ හරින්න.
- දෑස් නිසා අපට ලෝකය දැකිය හැකි ආකාරය සාකච්ඡා කරන්න.
- දෑස් යනු මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපට දී ඇති මහඟු දායාදයක් බව පවසන්න.
- අවට පරිසරයේ ඇසෙන ශබ්දවලට සවන් දීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇසීමෙන් අපට ලෝකය වටහා ගත හැකි ආකාරය සාකච්ඡා කරන්න.
- දෙසවන් යනු ද මහෝත්තම දෙවි පියාණන් වහන්සේ දුන් මහඟු දායාදයක් බව පවසන්න.
- පහත ගීතය සිසුන් සමග ගායනා කරමින් මහෝත්තම දෙවි පියාණන් වහන්සේට තුති පුදන්න.

*** යහපත් දේ දැන ගන්නට - කුරුලු ගීත අහ ගන්නට**
**මේ කන් දෙක මට දුන්නට - ස්තුති යි පියාණෙනි**

*** පලතුරුවල රස බලන්න - මිහිරි ගීත පද ගයන්න**
**පුංචි කටක් මට දුන්නට - ස්තුති යි පියාණෙනි**

*** ලස්සන ලෝකය බලන්න - ලස්සන දේවල් දකින්න**
**මේ ඇස් දෙක මට දුන්නට - ස්තුති යි පියාණෙනි**

පියවර 2 :
- නාසය, මුව ආදී අනෙකුත් විවිධ අවයවවලින් ඇති ප්‍රයෝජන පිළිබඳ සිසුන් සමග සුහද කතාබහක යෙදෙන්න.

- මල්, ඉඟුරු, දෙහි කොළ, කුරුඳු පොතු ආදි සුවඳ සහිත දේවල සුවඳ අත්විඳීමට ඉඩ සලසන්න.
- අපට නාසයක් ලබා දීමෙන් මහෝත්තම දෙවි පියාණන් වහන්සේ දක්වා ඇති ආදරය පිළිබඳ සාකච්ඡා කරන්න.
- පෙර ගැයූ ගීතය සිසුන් සමග නැවත ගායනා කරමින් යළියළිත් මහෝත්තම දෙවි පියාණන් වහන්සේට තුති පුදන්න.

පියවර 3 :
- බෝනික්කා ඉදිරිපත් කරමින් එහි ඇති අංගෝපාංග පෙන්වන්න.
- සුදුසු ළමා ගීතයකට සවන් දී එහි තාලයට නැටුමක් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.
- දෑත්, දෙපා ආදි අවයව අපට එහි දී ප්‍රයෝජනවත් වූ බව සිසුන්ට පැහැදිලි කරන්න.
- මහෝත්තම දෙවි පියාණන් වහන්සේ දුන් ශරීරය ආරක්ෂා කර ගත හැකි අයුරු සාකච්ඡා කරන්න.

පියවර 4 :
- මහෝත්තම දෙවි පියාණන් වහන්සේ දුන් ශරීරය තමන් ගේත්, අන් අය ගේත්, යහපත සඳහා යොදා ගැනීමෙන් අපට ඔවුන් වහන්සේට ප්‍රතිප්‍රේමය දැක්විය හැකි බව අවධාරණය කරන්න.
- **'ජීවිතය මට දුන් දෙවිතුමනේ'** ගීතිකාව සිසුන් සමග ගායනා කරමින් මහෝත්තම දෙවි පියාණන් වහන්සේට තුති පිදීමට සලස්වන්න.
- මහෝත්තම දෙවි පියාණන් වහන්සේ දුන් ශරීරය කිසිවකුට හෝ හිරිහැර කිරීමට යොදා නො ගත යුතු බව පෙන්වා දී සිසුන් සමග එක් ව පහත සඳහන් කවිය තාලයට ගායනා කරන්න.

**මට හිරිහැර කරනවාට කැමති නෑ මෙමා**
**අනෙක් අයත් හිරිහැරයට කැමති නෑ තමා**
**සතුටු නො වෙමි කිසි දෑසක් කඳුළකින් තෙමා**
**ජේසු සමිඳු වාගේ වෙමු පුංචි අපි සැමා**

පියවර 5 :
- සිසුන් එළිමහනේ කවාකාර ව සිටුවා දෛනික ජීවිතයේ තම ශරීරය පිරිසිදු ව තබා ගැනීමට කළ හැකි දේ විමසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 6 :
- පිරිසිදුකම ගැන කියැවෙන පහත සඳහන් ගීය ශබ්ද නගා කියමින් රඟ දැක්වීමට සිසුන් යොමු කරන්න.

* **උදෙන් ම නැගිටිමු දත් මදිමූ**
**මුහුණ සෝදලා කෑම කමූ**
**පිරිසිදු වීලා - දවස අරඹලා**
**දෙවිඳුන් හට වඳිමූ**
**පාසල වෙත සතුටින් ම යමූ**
**හොඳින් ඉගෙන ගෙන ගෙදර එමූ**
**පිරිසිදු වීලා - දවස ගෙවාලා**
**දෙවිඳුන් හට වඳිමූ**

**තක්සේරුව :**

- තම සිරුර පිරිසිදු ව තබා ගැනීමට කළ හැකි දේ නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- පෞද්ගලික පිරිසිදුකම රැක ගැනීම

## 1.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේට ආදරය කිරීම

**1.0 නිපුණතාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල ඇසුරෙන් අත්දකියි; තුති පුදයි; ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.3

- දෙමවුපියන්, සහෝදර සහෝදරියන්, නෑදෑ හිතමිතුරන් හා ගුරුවරුන් දේව තිළිණ බව ප්‍රකාශ කරයි.
- ඔවුන්ට උදව් උපකාර කළ හැකි අයුරු විස්තර කරයි.
- දෙමවුපියන්ට දේව රැකවරණය පතමින් ගීතිකාවක් ගායනා කරයි.
- හැම විට ම අපට යහපතක් ම පතන දෙමවුපියන්ට ආදරය, ගෞරවය දක්වමින් කීකරු විය යුතු බව ප්‍රකාශ කරයි.
- කතාන්දරයක සිදුවීම් චිත්‍රයකට නඟයි.

**ඉගෙනුම් සම්පත්** :

- පවුලේ අය එකමුතු ව සිටින පින්තූරයක්
- නෑදෑයන් සිටින පින්තූර
- කිතුනු ගී පොත

**ඉගෙනුම්-ඉගැන්වීම ක්‍රමෝපාය :**

පියවර 1 :
- පහත කතාන්දරය සිසුන්ට ඉදිරිපත් කරන්න.

  ''එකමත් එක රටක රජ කෙනෙක් සිටියා. ඔහු යටතේ වැඩට සිටි අයට ලැබෙන පිරිමි දරුවන් මරන්නට ඔහු නියෝග කළා. එක්තරා නිවසක අම්මා කෙනකුට පිරිමි දරුවකු ලැබුණා. දරුවා මරා දමා වි යැ යි බියෙන් ඒ මව දරුවා පන් පෙට්ටියක දමා, රජුගේ දුව දිය නෑමට පැමිණෙන ගඟේ පා කර හැරියා. මෙම දරුවාගේ අක්කා, මල්ලීට කරදරයක් වුව හොත් බේරා ගැනීමේ අදහසින් පඳුරක් අසල සැඟවී සිටියා. මේ වේලාවේ රජ කුමරිය යෙහෙළියන් ද සමග දිය නෑමට ගඟට ආවා.

  ඈ පන් පෙට්ටියේ සිටි ලස්සන දරුවා තුරුළු කර ගත්තා. දරුවා ආදරයෙන් හදාවඩා ගැනීමට රජ කුමරිය මවක සොයන බව සැඟවී සිටි අක්කා දුටුවා. ඇය දරුවාට මවක් සොයා දීමට ඉදිරිපත් වුණා. ඇය තමන්ගේ මව ම කුමරිය වෙත කැඳවා ගෙන ආවා. කුමරිය දරුවාට කිරි දී හදාවඩා ගැනීමට එම මවට භාර කළා. මේ නිසා තම දරුවා ආදරයෙන් හදා ගැනීමට ඇයට හැකි වුණා.''

- කතාන්දරය ඇසුරු කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්න සාකච්ඡා කරන්න.
  * බලන්න දරුවාගේ දෙමවුපියන් දරුවාට කොච්චර ආදරේ ද?
  * බලන්න අක්කා මල්ලීට කොච්චර ආදරේ ද?
  * ඔබට ඔබේ දෙමවුපියන්, සහෝදර සහෝදරියන් කො පමණ ආදරේ ද ?
- ඉහත කථාවේ තමා සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නැඟීමට සිසුන් යොමු කරන්න.

පියවර 2 :
- එකමුතු ව සිටින පවුලක පින්තූරයක් පෙන්වන්න
- සිසුන් සමග කිතුනු ගී අංක 465 ගායනා කරන්න.

**ලේ කිරි කරලා මට පෙව් අම්මා**
**මා ලෙඩ වූ විට නිදි මරමින් ළඟ ඉන්නා**
**මගේ විපතෙ දී මා අත් නො හරිනා**
**අනේ සමිඳුනේ මගෙ අම්මා රැක දේවා //**

**ඩහදිය හෙළලා වෙහෙසක් නො බලා**
**මා වෙනුවෙන් ජීවිතය ම පුදන තාත්තා**
**මගේ සැප පතා සැප අත් හරිනා**
**අනේ සමිඳුනේ මගෙ තාත්තා රැක දේවා //**

**පියවර 3 :**
- ඥාතීන් සිටින පින්තූරය සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එම පින්තූරයේ සිටින නැන්දලා, මාමලා, ආච්චි සහ සීයා පිළිබඳ සාකච්ඡා කරන්න.
- නෑදෑයින් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මේ සැම දෙනා ම මහෝත්තම දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය නිසා අපට ලැබුණු අය බවත්, ඒ අය ගේ ආදරය තුළින් අප මහෝත්තම දෙවි පියාණන් වහන්සේ හඳුනා ගන්නා බවත්, පැහැදිලි කර දෙන්න.

**තක්සේරුව :**

- මහෝත්තම දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය නිසා අපට ලැබුණ දෙමාපියන් වෙනුවෙන් තුති පුදමින් ගීතිකාව ගායනා කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා :**

- දිනපතා පාසලට පැමිණීමට පෙර දෙමාපියන් නැමැදීම

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**1.0 නිපුණතාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල ඇසුරෙන් අත්දකියි තුතිපුදයි; ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.4

- ගුරුවරුන්ට, අසල් වැසියන්ට සහ මිතුරු මිතුරියන්ට ආදරය කරයි, උපකාර කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- කඩදාසි මලක් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම්-ඉගැන්වීම ක්‍රමෝපාය :**

පියවර 1 :
- ගුරුවරුන්ට ආදරය කළ හැකි ආකාරය විමසන්න.
- ගුරුවරයා සමඟ ආදරයෙන් සිටින අවස්ථාවක් චිත්‍රයට නැගීමට සිසුන් යොමු කරන්න.
- කඩදාසි මලක් නිර්මාණය කර ගුරු දිනයේ දී ගුරුතුමියට පිළිගැන්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පහත ගීතය සාමූහික ව ගායනා කරන්න.

**ගුරුතුමී මගේ ආදර මැණී ම යි මගෙ දියුණුව දකින**
**ගුරුතුමා පියාණන් මගේ සදාදර මට ශිල්පය සදන**
**සුවපත් දීර්ඝායුෂ ම ලැබේ වා අදර ඔබට නිතින**
**ගුරු මාපියනට ජේසු සමිඳු ගේ පිහිට පතමි බැතින**

පියවර 2 :
- නිවස අවට අසල්වැසියන් හා මිතුරු මිතුරියන් තමාට උදව් කළ අවස්ථාවක් සහ තමා ඔවුන්ට උදව් කළ අවස්ථාවක් සිසුන් ගෙන් විමසන්න.
- පහත කථාව සිසුන්ට කියා දෙන්න.

  'කළු මාමා හරි නපුරු යි. යහළුවන්ට වත්, අසල්වැසියන්ට වත් උදව් කළේ නෑ. දවසක් කළු මාමා ගඟේ ගහගෙන ගියා. 'මා බේරා ගනියෝ' කියා කෑ ගැසුවා. අසල්වැසියන් එකතු වෙලා කළු මාමා බේරා ගත්තා. එදා ඉඳලා කළු මාමා අසල්වැසියන්ටත්, යාළුවන්ටත් උදව් කරන්න පටන් ගත්තා.'

  කළු මාමා දැන් නිතර ම මෙහෙම කියනවා. 'ජේසුස් වහන්සේ කියලා තියෙනවා අසල්වැසියන්ට ප්‍රේම කරන්න කියා.'

- මෙම කතාව රඟ දැක්වීමට සිසුන් යොමු කරන්න.
- අසල් වැසියන් සහ මිතුරු මිතුරියන් ද, මහෝත්තම දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය නිසා අපට ලැබුණු අය බවත්, ඒ අයගේ ආදරය මගින් අපි මහෝත්තම දෙවි පියාණන් වහන්සේ හඳුනා ගන්නා බවත්, පැහැදිලි කර දෙන්න.

**තක්සේරුව :**

- කඩදාසි මලක් නිර්මාණය කර ගුරුතුමාට/ගුරුතුමියට පිළිගන්වයි.
- කළු මාමා සම්බන්ධ නාට්‍යය රඟ දැක්වීමට ක්‍රියාකාරී ව සහභාගි වෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අසල්වැසි අයට සහ මිතුරු මිතුරියන්ට උදව් කිරීම

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**1.0 නිපුණතාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය මැවිල්ල ඇසුරෙන් අත් දකියි; තුති පුදයි; ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.5

- මහෝත්තම දෙවි පියාණන් වහන්සේ ගෙන් අප ලද ලස්සන ලෝකය වර්ධනය කිරීම සඳහා පාසල් භූමිය පිරිසිදු කර පැළ සිටුවා අලංකාර කරයි.
- සතුන්ට ආදරය දැක්වීම සඳහා කළ හැකි දෑ විස්තර කරයි.
- මහෝත්තම දෙවි පියාණන් වහන්සේ මැවූ ලෝකයේ යහපත් බව පසසමින් ගායනාවේ නිරත වෙයි.
- මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ප්‍රතිප්‍රේමය දක්වමින් ගස්වැල්, සතුන් ඇතුළු පරිසරය ආරක්ෂා කරමින් සකසුරුවමින් පරිහරණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- වත්තේ සිටුවීමට පලතුරු පැළයක්

**ඉගෙනුම්-ඉගැන්වීම ක්‍රමෝපාය** :

පියවර 1 :
- පාසල් භූමියේ කිසියම් ස්ථානයක් තෝරා ගනිමින් පන්තියේ සියලු සිසුන් සහභාගි කර ගනිමින් (අඹ වැනි) පලතුරු පැළයක් සිටුවන්න. (එය රැක බලා ගනිමින් සාත්තු කරන්නට වසර පුරා සිසුන් යොමු කරන්න.)
- පැළයක් සිටුවීමෙන් මහෝත්තම දෙවි පියාණන් වහන්සේ ගෙන් අප ලද ලස්සන ලෝකය වර්ධනය කළ හැකි බව පෙන්වා දෙන්න.
- පන්ති කාමරය අවට මල් පැළ සිටුවා ජලය දමා, වල් පැළ උදුරා පිරිසිදු කිරීමට දරුවන් යොමු කරන්න.
- එ සේ කිරීම දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්වීමක් බව තහවුරු කර පෙන්වන්න.
- පහත දැක්වෙන ගීතය සිසුන් සමග එක් ව ගායනා කරන්න.

  * **හිරු පායයි - අව්ව වැටෙයි - මල් සුපිපෙයි - ගස් නැළැවෙයි**

  **දෙවිඳුන් මේ හැම මැව්වේ අපට ආදරෙන්**

  **වැස්ස වසියි - පස සරු වෙයි - සිසිල දැනෙයි - ලොව සැනැසෙයි**

  **දෙවිඳුන් මේ හැම මැව්වේ අපට ආදරෙන්**

පියවර 2 :
- පාසල් වත්තේ ඇති කුරුලු ලැල්ලේ තමා ගෙන එන ආහාරවලින් කොටසක් තැබීමට සිසුන් යොමු කරන්න.
- එ සේ කිරීම දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්වීමක් බව තහවුරු කර පෙන්වන්න.
- ගස් , මල්, සුරතල් සතුන් මගින් මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ මැවිල්ලට ආදරය ඇති වන ලෙස සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සතුන්ට ආදරය දැක්වීම, කෑම බීම දීම, ලෙඩ වූ විට බෙහෙත් කිරීම, සතුන් පිරිසිදු කිරීම ආදි කටයුතුවලින් දේව මැවිල්ලට අපගේ ගෞරවය දැක්වීම ප්‍රකාශ වන බව සාකච්ඡා කරන්න.
- ඒ සැම ආරක්ෂා කිරීමෙන් අප ආදරය කරන්නේ මහෝත්තම දෙවි පියාණන් වහන්සේට බව සිසුන්ට වටහා දෙන්න.

- පහත දැක්වෙන ගීතය සිසුන් සමග එක් ව ගායනා කරන්න.

  * **පුංචි මගේ යාළුවේ මේ          අහන්නකෝ**<br>
  **දෙවිඳු ඔබව මැව්වෙ ආදරේ          නිසයි**<br>
  **මුළු ලොවට ම එතුමන් පෑ ආදරේ     නිසයි**<br>
  **නිල් අඹරේ පියඹා යන කුරුලු        යාළුවේ**<br>
  **සුනිල් දියේ පීනා යන යාළු          මාළුවේ**<br>
  **පුංචි ඔබට ජීවය දුන් දෙවිපියා ම       වේ**<br>
  **පුංචි මටත් ජීවය ලැබ දුන්නෙ        යාළුවේ**

**තක්සේරුව :**

- පැළයක් සිටුවා එය රැකබලා ගැනීමට දායක වෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- මල් වැවීමට සහ ගෙවත්තේ විවිධ දේ සිටුවීමට පෙලඹවීම

## 2.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේ සමග කතා කිරීම

## 2.0 නිපුණතාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේ සමග කතා කරයි.

**ඉගෙනුම් පල** : 2.1

- දේවස්ථානය නරඹයි.
- නිවැරදි ඉරියව්වෙන් මහෝත්තම දෙව් පියාණන් වහන්සේට නමස්කාර කර සුළු යාච්ඤාවක් කියයි.
- දේවස්ථානය තුළ නිහඬ වීමෙන් දේව ගෞරවය විදහා දක්වයි.
- වන්දනා ඉරියව් නියමාකාරයෙන් පෙන්නුම් කරමින් වන්දනාවේ ගීතිකාවක් ගායනා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- අසල ඇති දේවස්ථානය, කිතුනු ගී පොත

**ඉගෙනුම්-ඉගැන්වීම ක්‍රමෝපාය :**

පියවර 1 :
- සිසුන් දෙව් මැඳුරට කැඳවා ගෙන ගොස් දෙව් මැඳුර නිරීක්ෂණය කරවන්න.
- දෙව් මැඳුර ගැන කුඩා හැඳින්වීමක් කරන්න.
- මෙහි වැඩ සිටින දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට වැඳ නමස්කාර කළ යුතු බව පවසමින් පහත සඳහන් ගීතය සිසුන් සමග ගායනා කරන්න. (කිතුනු ගී - 344)

  වන්දනා කරමෝ සිරස නමා ///<br>
  පැසසුම් කර මෝ ගීත ගයා ///<br>
  ස්තුති කරමෝ දෝත නගා ///

- දණ නමස්කාර කිරීමේ ඉරියව් දරුවන්ට කියා දෙන්න. (දකුණු කකුල බිමට නමා නමස්කාර කර පෙන්වමින් සිසුන් ද ඒ සඳහා යොමු කරන්න.)

පියවර 2 :
- දේවස්ථානය තුළ නිහඬතාව සුරැකීමට සිසුන් යොමු කරන්න.
- හිස පහත් කිරීම, දොහොත් මුදුන් දී වැඳීම ආදර්ශනය කර පෙන්වන්න.
- නිවැරැදි ඉරියව්වෙන් මහෝත්තම දෙව් පියාණන් වහන්සේට නමස්කාර කර සිසුන් සමග සුළු යාච්ඤාවක් කරන්න.

**තක්සේරුව :**

- නිවැරැදි ඉරියව්වෙන් මහෝත්තම දෙව් පියාණන් වහන්සේට නමස්කාර කර සුළු යාච්ඤාවක් කියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා :**

- සෑම ඉරිදා දිනක ම දිව්‍ය පූජාවට සහභාගි වීම

## 2.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේ සමග කතා කිරීම

**2.0 නිපුණතාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේ සමග කතා කරයි.**

**ඉගෙනුම් පල** : 2.2

- සෑම යාච්ඤාවකට ම පෙර සාන්ත කුරුසය ලකුණ නිවැරැදි ව උච්චාරණය කරමින් සලකුණු කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- උත්තරීතර ජේසුස් වහන්සේ වැඩ සිටින ශ්‍රී කුරුසියක්
- කුරුසියක් නිර්මාණය කිරීමට සුදුසු ද්‍රව්‍ය

**ඉගෙනුම්-ඉගැන්වීම ක්‍රමෝපාය** :

පියවර 1 :
- උත්තරීතර ජේසුස් වහන්සේ වැඩ සිටින ශ්‍රී කුරුසිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ගුරු භවතා සියලු සිසුන්ට පෙනෙන අයුරින් කුරුසියේ ලකුණ අඳින අයුරු ආදර්ශනය කරන්න.
- සෑම ශිෂ්‍යයකුට ම (කේවල වශයෙන්) කුරුසියේ ලකුණ අඳින අයුරු පෙන්වීමට අවස්ථාව දෙන්න.
- වචන උච්චාරණය කරමින් ගුරුතුමිය සිසුන් සමග කීප වරක් කුරුසියේ ලකුණ ඇඳීමට සිසුන් යොමු කරන්න.

පියවර 2 :
- සාන්ත කුරුසිය අඳින අවස්ථා සිසුන් සමග සාකච්ඡා කොට සිසුන් ගෙන ආ ද්‍රව්‍ය යොදා ගනිමින් කුරුසයක් නිර්මාණය කිරීමට අවස්ථාව දෙන්න.

**තක්සේරුව** :

- සාන්ත කුරුසිය සලකුණු කරන ආකාරය නිවැරැදි ව පෙන්වයි.
- කුරුසයක් නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා** :

- උදේ අවදි වූ විගස සහ රාත්‍රී නින්දට යාමට පෙර සාන්ත කුරුසියේ ලකුණ ඇඳීම

## 3.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේ ගේ ම දරුවකු වීම

**3.0 නිපුණතාව : මහෝත්තම දෙව්පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි.**

**ඉගෙනුම් පල** : 3.1

- ප්‍රසාද ස්නාපනයෙන් දේව දරුවකු වන ආකාරය පැහැදිලි ව විස්තර කරයි.
- දේව දරුවා ස්වර්ග රාජ්‍යයට හිමි කරුවකු වන බව ප්‍රකාශ කරයි.
- ප්‍රසාද ස්නාපන අවස්ථාවක් සාමූහික ව රඟ දක්වයි.
- තම ඥාන මවුපියන් පිළිබඳ තොරතුරු කියයි.
- ශුද්ධෝත්තම පියතුමාට කීකරු ව ශුද්ධ වූ සභා සාමාජිකත්වයේ වගකීම් ඉටු කළ අවස්ථා නම් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ප්‍රසාද ස්නාපනය ලබන අවස්ථාවක ගත් ඡායාරූප, බෝනික්කෙක්, ජල බඳුනක්
- රඟපෑමට අවශ්‍ය ඇඳුම්
- ස්වර්ග රාජ්‍යය දැක්වෙන පින්තූරයක්
- නිරය පෙන්නුම් කරන පින්තූරයක්

**ඉගෙනුම්-ඉගැන්වීම ක්‍රමෝපාය** :

පියවර 1 :
- ක්‍රිස්තියානි කරන අවස්ථාවක් පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- එය 'ප්‍රසාද ස්නාපනය' යනුවෙන් හඳුන්වන බව සිහි ගන්වන්න.
- පියතුමා, මව හා පියා, ඥාන මව හා පියා, ලෙස සුදුසු සිසුන් ද, අනෙක් සිසුන් ඥාති හිත මිතුරන් ලෙස ද යොදා ගනිමින් විශාල බෝනික්කෙක් ගෙන්වා ප්‍රසාද ස්නාපන උත්සවය රඟ දක්වන්න.

පියවර 2 :
- කලින් කරන ලද දැන්වීමකට අනුව සිසුන් ප්‍රසාද ස්නාපනය ලබන අවස්ථාවේ දී ගත් ඡායාරූප ගෙන්වා ගෙන ඒවා හුවමාරු කර ගනිමින් කතාබහ කිරීමට ඉඩ දෙන්න.

පියවර 3 :
- ප්‍රසාද ස්නාපනය ලැබීමෙන් තමන් දේව දරුවකු වන බවත්, ජේසුස් වහන්සේ ගේ මිතුරකු වන බවත්, ශුද්ධ වූ සභාවට අයිති වන බවත්, එ සේ ම එහි නායකත්වයට අවනත විය යුතු බවත් සාකච්ඡා කරන්න.
- සිසුන් සමග පහත ගීතය ගායනා කරන්න.

  * අපි ජේසුගෙ යාළුවෝ //
  අපි ජේසුට ආදරෙයි //
  ජේසු අපට ආදරෙයි //

පියවර 4 :
- වර්තමාන ශුද්ධෝත්තම පියතුමාගේ ඡායාරූපයක් පෙන්වමින් ඔවුන් වහන්සේ ආදර්ශයට ගනිමින් තම ප්‍රසාද ස්නාපනීය වගකීම් ඉටු කළ යුතු බව පැහැදිලි කරන්න.

පියවර 5 :
- ප්‍රසාද ස්නාපනයෙන් දේව දරුවන් වූ අප දීමනා රාශියක් හිමි කර ගන්නා බවත්, ස්වර්ග රාජ්‍යයට උරුමකරුවන් වන බවත්, සිසුන් තුළ බලවත් සතුටක් ඇති වන ආකාරයට පවසන්න.
- ස්වර්ග රාජ්‍යය දිස්වෙන පෙළ පොතේ පින්තූර සිසුනට පෙන්වන්න.
- මෙලොව දී යහපත් කටයුතු කිරීමෙන් ස්වර්ග රාජ්‍යයට ඇතුළු විය හැකි ආකාරය සාකච්ඡා කරන්න.

- නිරයේ දර්ශනය දැක්වෙන පෙළ පොතේ පින්තූරය සිසුනට පෙන්වමින් පහත කරුණු ඉදිරිපත් කරන්න.
  * එදිනෙදා ජීවිතයේ දී අප අයහපත් ක්‍රියාවල නිරත වීම පාපය ලෙස හඳුන්වනවා.
  * පව් කරන අය ස්වර්ගයට යන්නේ නැති බව.
  * ඒ අය ඇතුළු වන්නේ නිරයට යි.
  * නිරයේ දුක් විඳීමට සිදු වෙනවා. හැඬීම්, වැලපීම් තිබෙනවා.
- සිසුන් කරන ලද යහපත් කටයුතු ඉදිරිපත් කරන්නට අවස්ථාවක් දෙන්න.
- සාමූහික ව පහත ගීතය ගායනා කරන්න.

**ජේසු සමිඳු පිළිගනිමු //**
**පව් සමාව නිති ලබමු**
**දැහැමි ලෙසින් දිවි ගෙවමු //**
**අපි සුර ලොව හිමි කර ගනිමු**
**හොඳ දේ නිරතුරු සිතමු //**
**යහපත් වචන ම කියමු**
**හැම විට හොඳ වැඩ කරමු //**
**අපි සුර ලොව හිමි කර ගනිමු**
**හිංසාවන් පිටු දකිමු //**
**පළි ගන්නට නොම සිතමු**
**කෝපය ඉවතට දමමු //**
**නිරයේ දොරටුව වසමු**
**බොරු කීමෙන් ඈත් වෙමු //**
**වංචාවට යොමු නො වෙමු**
**අයහපතින් අත් මිදෙමු //**
**නිරයේ දොරටුව වසමු**

**තක්සේරුව :**

- ප්‍රසාද ස්නාපන අවස්ථාව රඟ දැක්වීමට සාමූහික ව සහභාගි වෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ආදර්ශවත් දේව දරුවකු ලෙස කටයුතු කිරීම

## 4.0 තේමාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග

**4.0 නිපුණතාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.**

**ඉගෙනුම් පල** : 4.1

- මරිය මැණියන් යනු උත්තරීතර ජේසුස් වහන්සේ ගේ මැණියන් බව ප්‍රකාශ කරමින් නමෝ මරිය යාච්ඤාව භක්තියෙන් උච්චාරණය කරයි.
- දේව මැණියන් වහන්සේ තුළ තිබූ යහපත් ගුණාංග නම් කරයි.
- ජපමාලයක් නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- දේවමාතාවන්ගේ ප්‍රතිමාව සහ මල්
- කිතුනු ගී පොත
- ජපමාලයක්
- විවිධ පබළු හෝ ජපමාලයක් නිර්මාණයට සුදුසු ඇට වර්ග(55+4) සහ බකට් කම්බි
- කුරුසයක්
- සුබ පැතුම් පතක් නිර්මාණයට අවශ්‍ය දේ

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

පියවර 1 :
- දේව මැණියන්ගේ ප්‍රතිමාව තබා, සරසා, මලක් තැබීමට සෑම සිසුවකුට ම අවස්ථාව දෙන්න.
- දේව මැණියන්ට ගැයෙන ගීතිකාවක් සිසුන් සමග සාමූහික ව ගායනා කරන්න. (*නිදසුන්* : මරිය රැජිණියේ, සුරිඳු ජේසු මැණියේ, දෙපා ළඟ තබාලා, නෙළුම් පිපිලා, මා මවුනි)

පියවර 2 :
- දේව මැණියන් යනු උත්තරීතර ජේසුස් වහන්සේ ගේ මැණියන් බව හඳුන්වා දෙන්න.
- බැහැපත්කම, කීකරුකම, උදව් කිරීම වැනි දේව මැණියන්ගේ යහපත් ගුණාංග ඉස්මතු කර පෙන්වන්න.
- දේව මැණියන් හැඳින්වීමට භාවිතා කරන තවත් නාම ඉදිරිපත් කරන්න. (*නිදසුන්* : ලූර්දු මැණියන්, ජපමාල මැණියන්, කාර්මෙල් මැණියන්, රෝස කුසුමෙ මැණියන්, මඩු මැණියන් )
- 'දේව මැණියන්ගේ පිහිට ලැබේ වා' යි පතමින් මවට හෝ තමා ඉතා ආදරය කරන පැවිදි සොයුරියකට හෝ සුබ පැතුම් පතක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.

පියවර 3 :
- 'නමෝ මරිය' යාච්ඤාව යනු දේව මැණියන් මැදිහත් වන යාච්ඤාවක් බවත්, එය 'දේව දූත මංගලම්' නමින් හැඳින්වෙන බවත්, පැහැදිලි කරන්න.
- ජපමාලය පෙන්වමින් එය පිළිබඳ සිසුන් දන්නා දේ විමසමින් කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- අවශ්‍ය ද්‍රව්‍ය සපයා ජපමාලයක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.

**තක්සේරුව :**

- දේව මැණියන් තුළ තිබූ යහපත් ගුණාංග නම් කරයි.
- ජපමාලයක් නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දිනපතා නිවසේ දී දේව මැණියන්ට මලක් තබා නමෝ මරිය යාච්ඤාව උච්චාරණය කිරීම

## 4.0 තේමාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග

**4.0 නිපුණතාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.**

**ඉගෙනුම් පල** : 4.2

- සුරැකි පියා වූ ශුද්ධ වූ ජුසේ තුමා උත්තරීතර ජේසුස් වහන්සේ ආදරයෙන් රැකබලා ගත් බව ප්‍රකාශ කරයි.
- ශුද්ධ වූ ජුසේතුමාගේ යහපත් ගුණාංග විස්තර කරයි.
- සුබ පැතුම් පතක් නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- කිතුනු ගී පොත, ශුද්ධ වූ ජුසේ තුමා ගේ පින්තූරයක්, සුබ පැතුම් පතකට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

පියවර 1 : • ශුද්ධ වූ ජුසේතුමාට ගැයෙන පහත ගීතිකාව සිසුන් සමග ගායනා කරන්න. (කිතුනු ගී - 450)

ශ්‍රී කන්‍යා මැණියන්ගෙ දම්පත්‍යය ලෙසේ
තෝරා ගනු ලද්දා වූ සන් ජුසේ මුනින්දා

යුග ගැයුම : පාපි දාස රකින සේ

සැම දා ම යදින්නේ

බිළිඳු ජේසු නාතා ප්‍රේමෙන් දරු ලෙසේ
ආරක්ෂා කෙරුවා වූ සන් ජුසේ මුනින්දා

දෙව් අභිමත සේ ම සිත සන්තෝෂයෙනා
කල් ගත කෙරුවා වූ සන් ජුසේ මුනින්දා

පියවර 2 : • 'ශුද්ධ වූ ජුසේතුමාගේ පිහිට ලැබේ වා' යි පතමින් ශුද්ධ වූ ජුසේතුමා ගේ පින්තූරය ඇතුළත් සුබ පැතුම් පතක් තම පියා හෝ මීසමේ පියතුමා හෝ වෙනුවෙන් නිර්මාණය කිරීමට අවස්ථාව දෙන්න.

පියවර 3 : • මහෝත්තම දෙව් පියාණන් වහන්සේ උත්තරීතර ජේසුස් වහන්සේගේ පියා වුවත් මෙ ලොව දී උත්තරීතර ජේසුස් වහන්සේ රැක බලා ගත් පියා ශුද්ධ වූ ජුසේතුමා බවත්, එම නිසා එතුමා උත්තරීතර ජේසුස් වහන්සේ ගේ'සුරැකි පියා' ලෙස හඳුන්වන බවත් සාකච්ඡා කරන්න.

- \- • ශුද්ධ වූ ජුසේතුමා ගේ රැකියාව, එ තුමා ගේ ගතිගුණ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**තක්සේරුව** :

- තම පියා හෝ මීසමේ පියතුමා හට 'ශුද්ධ වූ ජුසේතුමා ගේ පිහිට ලැබේ වා' යි පතමින් සුබ පැතුම් පතක් සකසයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා** :

- තම 'සුරැකි පියා' වූ ශුද්ධ වූ ජුසේතුමාට උත්තරීතර ජේසුස් වහන්සේ උදව් කළා සේ, තම මව්පියන්ට උදව් කිරීම

## 4.0 තේමාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග

## 4.0 නිපුණතාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.

**ඉගෙනුම් ඵල** : 4.3

- නත්තලේ අරුත හෙවත් බෙදා ගැනීම, පන්ති කාමරය තුළ ක්‍රියාවට නංවයි.
- උත්තරීතර ජේසුස් වහන්සේගේ උපත රඟ දක්වයි.
- නත්තල් සුබ පැතුම් පතක් නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- කිතුනු ගී පොත, නත්තල් සුබ පැතුම් පත් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය, ලියුම් කවරයක්

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය** :

පියවර 1 :
- පහත ගීතිකාව ගායනා කරමින් කිතු උපත රඟ දැක්වීමට සිසුන් යොමු කරන්න. (කිතුනු ගී - 431)

  කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ - ශුද්ධ වූ නගරේ
  ජේසූ මෙ ලොවට බිහි වුණේ - පුංචි ගව මඩුවේ //
  උඳුවප් මාසේ සීතල දවසක මැදියම් රෑ යාමේ
  දෙව් මව් තුරුළේ උණුසුම ලබමින් මේ ලෝකෙට ආවේ
  සීත සුළං රැලි දසත හමද්දී සැතපීල යි උන්නේ
  දුප්පත් එඬේරු මේ බව දැන ගෙන ගවලෙන වෙත යන්නේ
  මරිය තුමීගේ පෙම්බර මුහුණේ එළියක් දිස් වූයේ
  ජුසේ තුමා කිසි දාකත් නෑ දෙවි අණකට පිටු පෑවේ
  වට පිට රොක් වී උම්බෑ ගාමින් හරකුන් කෑ ගසතී
  රජතුන් කට්ටුව බිළිඳු ළඟ වැටී පඬුරු ඔප්පු කරතී

- ගීතිකාව පිළිබඳ සාකච්ඡා කරමින් නත්තලේ අරුත සිසුන්ට පහදා දෙන්න. (උත්තරීතර ජේසුස් වහන්සේ උපන් ස්ථානය, වල්ගා තරුව, ගව මඩුව, එඬේරු, රජ තුන් කට්ටුව ආදිය)
- උත්තරීතර ජේසුස් වහන්සේ ගේ ගුණාංග පවසා නත්තලේ සතුට, දුගී අය සමග ද බෙදා ගත යුතු බව සාකච්ඡා කරන්න.

පියවර 2 :
- ගවලෙන, නත්තල් සමයේ පරිසරය, උත්තරීතර ජේසුස් වහන්සේගේ චරිතයේ විශේෂ සිද්ධි වැනි යමක් ඇතුළත් නත්තල් සුබ පැතුම් පතක් නිර්මාණය කර තමා ආදරය කරන වැඩිහිටියකුට දීමට සූදානම් කරවන්න.

පියවර 4 :
- සැඟවුණු නත්තල් සීයා (secret santa) ක්‍රියාකාරකමට සිසුන් යොමු කරන්න.
  * සිසුන් කැමති සුළු සිහිවටනයක් ගෙන ඒමට පෙර දිනයක දී උපදෙස් දෙන්න. නිද : සුබ පැතුම් පතක්, මලක්, පැන්සලක් වැනි දේ
  * පන්තියේ සිසුන් ගේ නම් ඇතුළත් තුණ්ඩු සකස් කර භාජනයකට දමන්න.
  * ඉන් එක බැගින් ලබා ගැනීමට සියලු ම සිසුන්ට අවස්ථාව දෙන්න.
  * එය රහසේ විවෘත කර බැලීමට උපදෙස් දෙන්න. තමා ලද තුණ්ඩුවේ නම සඳහන් මිතුරාට තමා නත්තල් සීයා වෙමින් එම තිළිණය පිරිනැමීමට යොමු කරන්න.

**තක්සේරුව :**

- උත්තරීතර ජේසුස් වහන්සේගේ උපත සිහි කරමින්, නත්තල් සුබ පැතුම් නිර්මාණය කරයි.
- 'සැඟවුණු නත්තල් සීයා' වෙමින් මිත්‍රත්වය පෙන්වයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සමගියෙන්, සාමයෙන් සහ සතුටින් නත්තල ගත කරයි.

## 4.0 තේමාව : උත්තරීතර ජේසුස් වහන්සේ ගේ සුවිශේෂ ගුණාංග

## 4.0 නිපුණතාව : උත්තරීතර ජේසුස් වහන්සේ ගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.

**ඉගෙනුම් පල** : 4.4

- උත්තරීතර ජේසුස් වහන්සේ කළ පළමු වන ප්‍රාතිහාර්යයෙන් ජේසුස් වහන්සේගේ බලවන්තකමත් උන්වහන්සේ තුළ තිබූ යහපත් භාවයත් ප්‍රකාශ කරයි.
- අන්අයගේ අවශ්‍යතාවක් දුටු විට ඔවුන් වහන්සේ උදව් කළ අවස්ථා නම් කරයි.
- පළමු වන ප්‍රාතිහාර්යය රඟ දක්වයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

පියවර 1 :
- උත්තරීතර ජේසුස් වහන්සේ කළ පළමු වන ප්‍රාතිහාර්යය වන කානා නුවර මඟුල් ගෙදර වතුර මිදි රසට හැරැවීමේ ප්‍රාතිහාර්යය ශුද්ධ බයිබලය ඇසුරින් සිසුන් ඉදිරියේ කියවන්න.
- උත්තරීතර ජේසුස් වහන්සේ පිළිබඳ භක්තිය ඇති වන සේ එම සිද්ධිය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සවන් දුන් කතාව රඟ දැක්වීමට සිසුන් යොමු කරන්න.

පියවර 2 :
- ශුද්ධ වූ ජොහන් 2 : 1 - 2 ඇසුරින් දේව මෑණියන්ගේ මැදිහත්භාවය සිසුන්ට පැහැදිලි කරන්න.

තක්සේරුව :

- කතාවේ කැමති අවස්ථාවක් චිත්‍රයට නගයි.

ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා

- අවශ්‍යතාවක් දුටු විට අන් අයට උදව් කිරීම

## 4.0 තේමාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග

## 4.0 නිපුණතාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.

**ඉගෙනුම් පල** : 4.5

- උත්තරීතර ජේසුස් වහන්සේ අපට ඇති ආදරය නිසා දුක් විඳ, මරණයට පත් ව, උත්ථාන වූ බව ප්‍රකාශ කරයි.
- උත්තරීතර ජේසුස් වහන්සේට ඇති ආදරය පෙන්වීමට පුංචි මර්දන ක්‍රියා ඇතුළත් ආත්මික මල් පොකුරක් සකස් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- කිතුනු ගී පොත
- පාද නමස්කාරයේ ස්ථාන ඇතුළත් පින්තූර
- ආත්මික මල් පොකුර නිර්මාණයට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

පියවර 1 :
- සිසුන් සමග එක් ව පහත ගීතිකාව ගායනා කරන්න. (කිතුනු ගී - 80)

මා සඳහා දිවි පිදුවේ
මරණෙන් හෝ උත්ථාන වුණේ
ඔබ ඇර වෙන කවුදෝ කවුදෝ
ජේසු මගේ කිතු සමිඳේ
වින විපතට හෝ වේවා
දුක් වෙයිනට හෝ වේවා
කිතු සමිඳුන්ගේ ප්‍රේමෙන් හා
කාට හැකි ද වෙන් කරනට මා

පියවර 2 :
- උත්තරීතර ජේසුස් වහන්සේ දුක් විඳ, මරණයට පත් වූ (උකුත් වූ) ආකාරය සිසුන් සමග කථා කරන්න.
- දේවස්ථානයක් වෙත සිසුන් කැඳවා ගෙන ගොස් (හෝ පාද නමස්කාරයේ ස්ථාන අඩංගු පින්තූර පෙන්වමින්) උත්තරීතර ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය විස්තර කරන්න.
- උත්තරීතර ජේසුස් වහන්සේට ඇති ආදරය නිසා අපට කළ හැකි භක්ති අභ්‍යාස කිරීමට i ishq af hduqj rk ka ' ^*උදා* : මර්දන ක්‍රියා, පාද නමස්කාරය)

පියවර 3 :
- මරණය පරාජය කළ ජේසුස් වහන්සේ අප වෙනුවෙන් උත්ථානය දිනා ගත් බව තහවුරු කර දී, උන් වහන්සේට ආදරය කිරීමට පුංචි මර්දන ක්‍රියා ඇතුළත් ආත්මික මල් පොකුරක් සකස් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**තක්සේරුව** :

- උත්තරීතර ජේසුස් වහන්සේගේ උකුත් වීම හා උත්ථානයට සම්බන්ධ වීම සඳහා ආත්මික මල් පොකුර නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා** :

- දේවස්ථානයේ පාද නමස්කාරයට සහභාගි වීම

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන් ගේ චරිත

## 5.0 නිපුණතාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.

**ඉගෙනුම් පල** : 5.1

- කතෝලික භක්තිකයන්ගේ උතුම් ම ග්‍රන්ථය දේව වචනය අඩංගු ශුද්ධ බයිබලය බව ප්‍රකාශ කරයි.
- ශුද්ධ බයිබලයට ගරු බුහුමන් දැක්විය යුතු ආකාරය පන්ති කාමරය තුළ ක්‍රියාවට නංවයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

පියවර 1 :
- ශුද්ධ බයිබලය පන්ති කාමරයේ තැබීමට සුදුසු ස්ථානයක් සකස් කරන්න.
- ශුද්ධ බයිබලය පෙරහරින්, ළමුන් සමග පන්තියේ එම ස්ථානයට රැගෙන එන්න.
- ගෞරවයෙන් යුක්ත ව ශුද්ධ බයිබලය එහි තැන්පත් කරන්න.

පියවර 2 :
- දේව වචනය (මහෝත්තම දෙවි පියාණන් වහන්සේ ගේ ආදර වචන) අඩංගු පොත ශුද්ධ බයිබලය බව හඳුන්වා දෙන්න.
- කතෝලික භක්තිකයන්ගේ උතුම් ම ග්‍රන්ථය මෙය බව සාකච්ඡා කරන්න.
- උත්තරීතර ජේසුස් වහන්සේගේ උපතට පෙර සහ පසු සිදු වූ දේ එහි ලියැවී ඇති බව ද පෙන්වා දෙමින් පුරාණ ගිවිසුම හා අලුත් ගිවිසුම වශයෙන් ශුද්ධ බයිබලය කොටස් දෙකකට බෙදෙන බව පැහැදිලි කරන්න.

**තක්සේරුව** :

- ශුද්ධ වූ බයිබලයට නිසි ගෞරවය දක්වයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දේව වචනය පිළිපදිමින් ශුද්ධ බයිබලයට නිසි ගෞරවය දැක්වීම

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**5.0 නිපුණතාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.**

**ඉගෙනුම් පල** : 5.2

- ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා අප රටේ අපෝස්තුළුවරයා බව ප්‍රකාශ කරයි.
- උන් වහන්සේ උත්තරීතර ජේසුස් වහන්සේට ආදරය කළ නිසා අප රටට පැමිණ ජීවිත පරිත්‍යාගයෙන් විශ්වාසය ආරක්ෂා කර දුන් බව ප්‍රකාශ කරයි.
- 2015 වසරේ දී ශුද්ධෝත්තම පියතුමා අප රටට පැමිණ උන්වහන්සේ ව සාන්තුවර තත්ත්වයට එසවීම සිදුකළ බව සාකච්ඡා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගේ පින්තූරයක්
- කිතුනු ගී පොත

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

පියවර 1 :
- පින්තූරය පෙන්වමින් ගීතිකාව ගායනා කරන්න. (කිතුනු ගී 460)
- සියලු උවදුරුවලින් මුදාලන සාන්තුවරයකු ලෙස ශු. ජුසේ වාස් මුනිතුමා හඳුන්වන්න.
- විශ්වාසය රැකදුන් සාන්තුවරයකු ලෙස හඳුන්වා දෙමින් ඔවුන් වහන්සේට අප ගෞරව කළ යුතු බව සාකච්ඡා කරන්න.

තක්සේරුව :

- දුක් කරදර හමුවේ විශ්වාසය රැකදුන් සාන්තුවරයා ලෙස ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සාන්තුවරයන්ට ගෞරව දැක්වීම
- ශුද්ධ වූ ජුසේ වාස් මුනිඳුන් පරිහරණය කළ කුරුසියට වන්දනා කිරීම

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**5.0 නිපුණතාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.**

**ඉගෙනුම් පල** : 5.3

- දේව මෑණියන්ගේ මව සාන්ත ආනාතුමිය බව ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- සාන්ත ආනාතුමියගේ පින්තූරයක්
- කිතුනු ගී පොත

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

පියවර 1 :
- සාන්ත ආනාතුමියගේ පින්තූරය සිසුනට පෙන්වමින් 'සන්තානා මෑණියනේ ...' (කිතුනු ගී - 451) ගීතිකාව සිසුන් සමග ගායනා කරන්න.
- සාන්ත ආනාතුමිය දේව මාතාවන් ගේ මව බව ද, ජුවකීම්තුමා දේව මාතාවන් ගේ පියා බව ද සිසුන්ට පැහැදිලි කරන්න.
- මේ දෙදෙනා උත්තරීතර ජේසුස් වහන්සේගේ ආච්චි හා සීයා බව ද, තලවිල දෙව්මැඳුර සාන්ත ආනා මුනිවරියට කැප කර ඇති බව ද ප්‍රකාශ කරන්න.

**තක්සේරුව** :

- සාන්ත ආනාතුමිය සම්බන්ධ ගීතිකාව ගායනා කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සාන්ත ආනාතුමියට ගෞරව දැක්වීම

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

## 5.0 නිපුණතාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.

**ඉගෙනුම් පල** : 5.4

- සාන්ත අන්තෝනි මුනිතුමා හොඳ දේශකවරයෙක් බව ප්‍රකාශ කරයි.
- උන් වහන්සේ සාන්තුවරයකු වූයේ උත්තරීතර ජේසුස් වහන්සේට මහත් සේ ආදරය කළ නිසා බව ප්‍රකාශ කරයි.
- පුංචි සාන්තුවරයන් සේ තමන්ට ද ජේසුස් වහන්සේට ආදරය කළ හැකි අයුරු සාකච්ඡා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- සාන්ත අන්තෝනි මුනිතුමාගේ පින්තූරයක්
- කිතුනු ගී පොත

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

පියවර 1 :
- සාන්ත අන්තෝනි මුනිතුමාගේ පින්තූරය සිසුන්ට පෙන්වමින් 'පාදුවා නගරයේ ...' (කිතුනු ගී - 456) ගීතිකාව සිසුන් සමග ගායනා කරන්න.
- උත්තරීතර ජේසුස් වහන්සේගේ නාමයෙන් බොහෝ පුදුම දේ කළ සාන්තුවරයකු ලෙස මෙ තුමා හඳුන්වා දෙමින් එ තුමා දක්ෂ දේශකයකු බව ද පවසන්න.
- කොළඹ කොච්චිකඩේ දෙව් මැඳුර ශාන්ත අන්තෝනි මුනිතුමාට කැප කර ඇති බව සාකච්ඡා කරන්න.
- සාන්ත අන්තෝනි මුනිතුමා උත්තරීතර ජේසුස් වහන්සේ වෙනුවෙන් තම ජීවිතය කැප කළ අයකු බවත්, ඔවුන් වහන්සේට අප ගෞරව කළ යුතු බවත්, සාකච්ඡා කරන්න.

**තක්සේරුව** :

- සාන්ත අන්තෝනි මුනිතුමා පිළිබඳ වාක්‍යයක් පවසයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සාන්ත අන්තෝනි මුනිතුමාට ගෞරව දැක්වීම

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**5.0 නිපුණතාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.**

**ඉගෙනුම් පල** : 5.5

- සාන්ත සෙබස්තියන් මුනිතුමා තම ජීවිතය ශුද්ධ වූ සභාව උදෙසා පූජා කළ බව ප්‍රකාශ කරයි.
- ඔවුන් වහන්සේ සාන්තුවරයකු වූයේ ජේසුස් වහන්සේට මහත් සේ ආදරය කළ නිසා බව ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- සාන්ත සෙබස්තියන් මුනිතුමාගේ පින්තූරයක්
- කිතුනු ගී පොත

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

පියවර 1 :
- සාන්ත සෙබස්තියන් මුනිතුමාගේ පින්තූරයක් පෙන්වමින් 'සත් සෙබස්තියන් මුනිඳුනි ...' (කිතුනු ගී - 453) ගීතිකාව සිසුන් සමග ගායනා කරන්න.
- විශේෂයෙන් බෝ වන රෝග සුව කිරීමට අප වරම් ඉල්ලන සාන්තුවරයා වශයෙන් මෙතුමා හඳුන්වන්න.
- මොරටුව, කඳාන යන ප්‍රදේශවල සාන්ත සෙබස්තියන් මුනිතුමා වෙනුවෙන් කැප කර ඇති දෙව් මැදුරු ඇති බව සිසුන්ට කියා දෙන්න.
- සාන්ත සෙබස්තියන් මුනිතුමා උත්තරීතර ජේසුස් වහන්සේ වෙනුවෙන් තම ජීවිතය කැප කළ අයකු බවත්, ඔවුන් වහන්සේට අප ගෞරව කළ යුතු බවත්, සාකච්ඡා කරන්න.

**තක්සේරුව** :

- බෝ වන රෝග සුව කිරීමට අප වරම් ඉල්ලන සාන්තුවරයා වශයෙන් සාන්ත සෙබස්තියන් මුනිතුමා නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සාන්තුවරයන්ට ගෞරව දැක්වීම

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**5.0 නිපුණතාව** : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.

**ඉගෙනුම් පල** : 5.6

- අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා වර්තමාන කතෝලික සභාවේ නායකයාණන් බව පිළිගනියි.

**ඉගෙනුම් සම්පත්** :

- අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ පින්තූරයක්

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

- අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ පින්තූරය පෙන්වමින් උන්වහන්සේ අප සභාවේ නායකයාණන් බව හඳුන්වා දෙන්න.
- උන්වහන්සේගේ සරල පැවැත්ම ගැන සඳහන් කරන්න.

**තක්සේරුව** :

- කතෝලික සභාවේ දෘෂ්‍යමාන නායකයාණන් උන්වහන්සේ බව නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- උන්වහන්සේට කීකරු වීම සහ ගෞරව කිරීම.

# තක්සේරු කිරීම

# කතෝලික ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව

| | | | | | | ශිෂ්‍යගේ නම |
|---|---|---|---|---|---|---|
| | | | | | | 1. ලස්සන ලෝකය දුන් මහෝත්තම දෙවි පියාණන් පැසසීම පිණිස, මහෝත්තම දෙවි පියාණන් වහන්සේ මැවූ දේ අලවා විශාල පෝස්ටරයක් නිර්මාණය කරයි. |
| | | | | | | 2. මහෝත්තම දෙවි පියාණන් වහන්සේගෙන් තමන්ට ලැබුණු ශරීරය වෙනුවෙන් තුති පිදීම සඳහා ගීත ගායනා කරයි. |
| | | | | | | 3. මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය නිසා අපට ලැබුණ දෙමවුපියන් වෙනුවෙන් තුති පුදමින් ගීතිකාව ගායනා කරයි. |
| | | | | | | 4. කඩදාසි මලක් නිර්මාණය කර ගුරුතුමාට/ගුරුතුමියට පිළිගන්වයි. |
| | | | | | | 5. පැළයක් සිටුවා එය රැකබලා ගැනීමට දායක වෙයි. |
| | | | | | | 6. තම සිරුර පිරිසිදු ව තබා ගැනීමට කළ හැකි දේ නම් කරයි. |
| | | | | | | 7. 'හොඳ ළමයා දිනයේ' දී ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස හැසිරෙයි. |
| | | | | | | 8. දෙමවුපියන් සමග එක් ව යහපත් කටයුතු කරමින් දෙවියන් වහන්සේට ප්‍රතිප්‍රේමය දැක්විය හැකි අයුරු චිත්‍රයට නගයි. |
| | | | | | | 9. දැහැමි ළමයකු සතු විය යුතු ලක්ෂණ නම් කරයි. |
| | | | | | | 10. නිවැරදි ඉරියව්වෙන් දෙවියන් වහන්සේට නමස්කාර කර සුළු යාච්ඤාවක් කියයි. |
| | | | | | | 11. සාන්ත කුරුසිය සලකුණු කරන ආකාරය නිවැරදි ව පෙන්වයි. |
| | | | | | | 12. කුරුසියක් නිර්මාණය කරයි. |
| | | | | | | 13. ප්‍රසාද ස්නාපන අවස්ථාව රඟ දැක්වීමට සාමූහික ව සහභාගි වෙයි. |
| | | | | | | 14. දේව මෑණියන් වහන්සේ තුළ තිබූ යහපත් ගුණාංග නම් කරයි. |
| | | | | | | 15. ජපමාලයක් නිර්මාණය කරයි. |
| | | | | | | 16. තම පියා හෝ මීසමේ පියතුමාට 'ශුද්ධ වූ ජුසේතුමාගේ පිහිට ලැබේ වා' යි පතමින් සුබ පැතුම් පතක් සකසයි. |
| | | | | | | 17. උත්තරීතර ජේසුස් වහන්සේගේ උපත සිහි කරමින්, නත්තල් සුබ පැතුම් පත් නිර්මාණය කරයි. |
| | | | | | | 18. 'සැඟවුණු නත්තල් සීයා' වෙමින් මිත්‍රත්වය පෙන්වයි. |
| | | | | | | 19. උත්තරීතර ජේසුස් වහන්සේගේ උකුත් වීම හා උත්ථානයට සම්බන්ධ වීම සඳහා ආත්මික මල් පොකුරක් නිර්මාණය කරයි. |
| | | | | | | 20. සාන්තුවරයන් දෙදෙනකු නම් කරයි. |

| | |
|---|---|
| ප්‍රවීණතා මට්ටමට පැමිණ ඇත. | √ |
| ප්‍රවීණතා මට්ටමට පැමිණ නැත. | • |